# අධ්‍යාපනික සඟරා අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග අපේක්ෂකයින්ට සිදුකරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්; ගම්පහ දිස්ත්‍රික්කයට විශේෂිතව

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***පී.එම්.ඩී.අයි.එස්.පෙරේරා[1]***
***චන්ද්‍රසිරි රාජපක්ෂ[2]***

**සංක්ෂේපය**

මුද්‍රිත මාධ්‍ය පිළිබඳ වර්ගීකරණයට අදාළව "යුනෙස්කෝව" දිනපතා පුවත්පත්, දිනපතා නොවන පුවත්පත් සහ වාර ප්‍රකාශන යනුවෙන් ප්‍රධාන ප්‍රකාශන වර්ග තුනක් ඉදිරිපත් කර ඇත. එකී මුද්‍රිත මාධ්‍ය තුළ වාර ප්‍රකාශන හෙවත් සඟරාවන්ට හිමිවන්නේ විශේෂිත ස්ථානයකි. ශ්‍රී ලංකාවේ සඟරා ක්ෂේත්‍රය පුළුල්ව පැතිරී ඇති අතර ඉන් අධ්‍යාපනික සඟරා ප්‍රකාශයට පත්වීම කැපී පෙනෙයි. එහිදී ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය කේන්ද්‍ර කරගනිමින් අධ්‍යාපනික සඟරා ප්‍රකාශයට පත්වේ. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සඳහා සා.පෙළ සතර හා සාමාන්‍ය පෙළ චතුර යන මාසික අධ්‍යාපනික සඟරා ප්‍රකාශයට පත්කෙරේ.

එම අධ්‍යාපනික සඟරා මඟින් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග අපේක්ෂකයින්ගේ අධ්‍යාපන කාර්ය කෙරෙහි සිදුකරන බලපෑමක් තිබේද යන්න අධ්‍යයන ගැටලුවයි. උපන්‍යාසය ලෙස අධ්‍යාපනික සඟරා අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග අපේක්ෂකයින්ගේ අධ්‍යාපන කාර්ය කෙරෙහි බලපෑම් කරයි යන්න භාවිතයට ගෙන ඇත. එම අධ්‍යයනය ගම්පහ දිස්ත්‍රික්කයට විශේෂිතව අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග අපේක්ෂකයින් කේන්ද්‍ර කරගනිමින් සිදුකෙරුණි. එම අධ්‍යයනයේ අරමුණ වූයේ මාධ්‍ය මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන සතර හා චතුර වැනි අධ්‍යාපනික සඟරා කේන්ද්‍ර පාඨකයින්ගේ අධ්‍යාපන කාර්යයට බලපෑමක් ඇති කරනවාද යන්න අධ්‍යයනයයි. ඒ සඳහා අන්තර්ගත විශ්ලේෂණය, ප්‍රශ්නාවලි සහ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදී.

මෙම අධ්‍යයනයේ දී අධ්‍යාපනික සඟරා අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග අපේක්ෂකයින්ගේ අධ්‍යාපන කාර්ය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති නොකරන බව නිගමනය විය. එයට හේතු වී ඇත්තේ උපකාරක පංති හේතුවෙන් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග අපේක්ෂකයින් කාර්යබහුල වීම සහ ඔවුන් අන්තර්ජාල භාවිතයට නැඹුරුවීමයි.

**ප්‍රමුඛ පදඃ අ.පො.ස සාමාන්‍යපෙළ, අධ්‍යාපනික**

1. *ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*
2. *මහාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*